(ඊ) "එක් ගමකට එක් ව්‍යවසායකයෙක්" ව්‍යාපෘතිය යටතේ පොල්කටු ආශ්‍රිත නිෂ්පාදන වැඩි දියුණු කිරීම සඳහා ලග්ගල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ ප්‍රතිලාභියකු වෙත 2022 මාර්තු 24 දින ලබාදී තිබුණු රු. 43,425 ක භාණ්ඩ කට්ටලය 2023 පෙබරවාරි 24 පරීක්ෂණ දිනය වන විටත් භාවිතයට ගෙන නොතිබුණි.

(උ) ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව මඟින් ලෝක ආහාර වැඩසටහන යටතේ විල්ගමුව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ අලියාවල, වෙහෙරගල හා නාමිණිගම යන ග්‍රාම නිලධාරී වසම්වල පතස් ඉදිකල ප්‍රතිලාභීන් වෙත ලබා දී තිබුණු එකතුව රු. 3,387,200 ක ක්ෂුද්‍ර ජල සම්පාදන පද්ධති ස්ථාපිත කිරීමට අවශ්‍ය යන්ත්‍ර හා උපාංග යොදා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඌ) සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ දඹුල්ල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ ලොකුළුණු බීජ නිෂ්පාදකයින් දිරිගැන්වීමේ අරමුණින් 2022 පෙබරවාරි හා මාර්තු යන මාසවල දිගම්පතහ ලොකු එණු බීජ නිෂ්පාදන සමිතිය වෙත ලබාදී තිබුණු රු.1,246,365 ක වල්කපන යන්ත්‍ර 04 ක් හා කොම්පොස්ට් කැබලි කිරීම යන්ත්‍ර 03 ක් හා කළුන්දාව-පරණගම ලොකු එණු බීජ නිෂ්පාදන සමිතිය වෙත ලබාදී තිබුණු රු. 444,000 ක කුඩා අත් ට්‍රැක්ටර් 03 ක් 2023 පෙබරවාරි 07 පරීක්ෂණ දිනය වන විටත් නිෂ්කාර්යයව පැවතුණි.

(එ) කාන්තා ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය ප්‍රතිපාදන යටතේ අඹන්හගකෝරළේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ කිතුල් නිෂ්පාදන ගම්මාන පිහිටුවීම යටතේ පැණි නිෂ්පාදනය සඳහා රජයේ දායකත්වයෙන් ප්‍රතිලාභීන් 04 ක් වෙත රු. 215,640 ක උපකරණ ලබාදී තිබුණද 2023 මාර්තු 01 පරීක්ෂණ දිනය වන විටත් එම උපකරණ යොදාගෙන පැණි නිෂ්පාදන කටයුතු සිදු කර නොතිබුණි.

(ඒ) වේවැල්, පිත්තල, මැටි, ලී බඩු හා ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය ප්‍රතිපාදන යටතේ එක් ගමකට එක් ව්‍යවසායකයෙක් බිහි කිරීමේ වැඩසටහන මඟින් නාඋල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ හබරගහමඩ වසමේ පදිංචි ප්‍රතිලාභියකු වෙත පොල්කටු ආශ්‍රිත නිෂ්පාදන සිදු කිරීම සඳහා ලබා දී තිබුණු රු. 44,700 ක විද්‍යුත් උපාංග, 2023 පෙබරවාරි 20 දින වන විටත් භාවිතයට ගෙන නොතිබුණි.

3.1.3 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

ප්‍රවාහන හා මහා මාර්ග අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ කුරුණෑගල හබරණ දුම්රිය මාර්ගය ඉදිකිරීමට අදාල ඉඩම අත්පත් කර ගැනීම සඳහා 2022 වර්ෂයේ පරිපාලන වියදම් වශයෙන් රු. 946,599 ක මුදලක් දඹුල්ල ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් ගෙවා තිබුණද, එම ව්‍යාපෘතිය 2023 පෙබරවාරි 28 දින අත්හිටුවීමට තීරණය කිරීම හේතුවෙන් ගෙවීම් කරන ලද පරිපාලන වියදම් නිෂ්කාර්යය වියදමක් වී තිබුණි.

3.1.4 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

විල්ගමුව ප්‍රාදේශිය රෝහලේ ඉදිකරමින් පවතින රුධිර කාන්දුකරණ ඒකකය සඳහා 2022 දෙසැම්බර් 31 දිනට රු. 14,787,466 ක් වැයකර තිබුණ ද පොලව කොන්ක්‍රීට් කර කොන්ක්‍රීට් කුළුණු පමණක් ඔසවා තිබුණු අතර ඉතිරි ඉදිකිරීම් කටයුතු සිදු නොවීම හේතුවෙන් 2022 දෙසැම්බර් 31 දක්වා දරන ලද රු.14,787,466 ක වියදම නිෂ්කාර්ය වී තිබුණි.

3.1.5 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

රත්නොට.ලග්ගල, විල්ගමුව, අඹන්හගකෝරළේ හා නාඋල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශවල ග්‍රාමශක්ති ව්‍යාපාරය සඳහා වසර 04 කට පමණ පෙර ග්‍රාම නිලධාරි වසම 59 ක සමිති වෙත ලබාදී තිබුණු රු. 19,700,715 ක මුදලක් අරමුණුගත කාර්යය සඳහා යොදවා ගැනීමකින් තොරව බැංකු ගිණුම් වල නිෂ්කාර්යයව පැවතුණි.

3.2 මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සමාලෝචිත වර්ෂයේ පවිත්‍රතා කටයුතු සඳහා සැපයුම්කාර ආයතනයෙන් සේවය ලබා නොගත් දින සඳහාද රු. 99,356 ක් ගෙවා තිබුණි.

(ආ) යටවත්ත ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ ග්‍රාමීය මාර්ග වැඩසටහන යටතේ ව්‍යාපෘති 03 ක පාර දෙපස උරහිස පිරවීම වෙනුවෙන් රු.50,000 ක වියදමක් දරා තිබුණද එම වැඩ කොටස් ඉටුකර නොතිබුණි.

3.3 කළමනාකරණ දුර්වලතා

(අ) දිස්ත්‍රික් සැලසුම් අධ්‍යක්ෂ සඳහා නිවසේ සිට කාර්යාලයට ප්‍රවාහන පහසුකම් සැලසීමේදී වාහනය රාත්‍රී කාලයේ නිවස ආසන්නයේ ආරක්ෂිත ස්ථානයක ගාල්කිරීමට පහසුකම් සලසා නොගෙන දිනකට දෙවරක් අදාළ නිවස හා කාර්යාලය අතර ධාවනය කර තිබීම හේතුවෙන් කි.මී 4,674 ක් අනාර්ථිකව ධාවනය කර තිබුණි.

(ආ) මාතලේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ හිටපු ප්‍රාදේශිය ලේකම්වරියක් ස්ථාන මාරුවී යාමෙන් පසුව 2021 ජනවාරි 11 දින සිට 2022 නොවැම්බර් 29 දක්වා කාලය තුළද ප්‍රාදේශිය ලේකම් නිල නිවාසයේ පදිංචිව සිටියද එම කාලය සඳහා නිවාස කුලි අයකරගෙන නොතිබුණි.

(ඇ) අඹන්හගකෝරළේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ කරගහතැන්න විකාශනාගාරය පිහිටි ඉඩම හා ෆයිනස් වන වගාවේ සංරක්ෂණ කටයුතු සඳහා අවස්ථා 04 ක් යටතේ ව්‍යාපෘති 05 ක් වෙනුවෙන් ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු සඳහා වර්ෂ 08 සිට වර්ෂ 11 අතර කාලයක් ගත වී ඇතත්, එම කටයුතු අවසන් වී නොතිබුණි.

(ඇ) මිරිස්ගෝනියාඔය ගංවතුර අවහිරතාවයන් ඉවත්කිරීමේ ව්‍යාපෘතිය යටතේ කපා දමා තිබුණු මී,කුඹුක්, අට්ටික්කා,මිල්ල හා කරඳ ඇතුළු ගස් 43 ක් ඔය ඉවුරේ දිරාපත් වෙමින් පැවති අතර වසරකට අධික කාලයක් ගත වී තිබුණ ද එම ගස් මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශය අනුව රාජ්‍ය දැව සංස්ථාවට භාර දීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) ගලේවෙල, මාතලේ, දඹුල්ල හා නාඋල ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල විශ්‍රාම ගිය, වැඩ තහනමට ලක්වූ හා සේවය හැර ගොස් ඇති නිලධාරීන් 05 දෙනෙකුගේ එකතුව රු.773,507 ක ණය ශේෂයක් අයකර ගෙන නොතිබුණි.

4. යහපාලනය

මහජනයා වෙත සේවා ඉටු කිරීම

(අ) සමාලෝචිත වර්ෂයේ විල්ගමුව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරී වසම් 09 ක සුළි සුළං තත්වයක් හේතුවෙන් ඇතිවී තිබුණු නිවාස හානි 30 ක් හා වන අලි හානි 06 ක් සඳහා එකතුව රු. 1,782,898 ක වන්දි මුදල් සමාලෝචිත වර්ෂයේ නොවැම්බර් 02 දින වනවිටත් ගෙවීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2016 අප්‍රේල් 11 දිනැති අංක 06/2016 දරන කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛයේ 4 උප වගන්තියට අනුව ගැබිණි මව්වරුන්ට පෝෂණ දීමනාව ලබාදීමේ ප්‍රාදේශිය මට්ටමේ වගකීම හා අධීක්ෂණය ප්‍රාදේශිය ලේකම් කාර්යාල වෙත පැවරී තිබුණද මාතලේ හා නාඋල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශවල ප්‍රතිලාභීන් අවස්ථා 2015කදී එකතුව රු.4,030,000 ක පෝෂණ මල්ල ලබාගෙන නොතිබුණි.

5. මානව සම්පත් කළමනාකරණය

අනුයුක්ත කාර්ය මණ්ඩලය ,කර්‍ය කාර්ය මණ්ඩලය

2022 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ඒ යටතේ පවතින ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල කාර්යය මණ්ඩලයේ පුරප්පාඩු 189 ක් සහ අතිරික්ත 329 ක් පැවතුණි.

එච්.ඒ.ආනන්ද
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

පිටපත :- අධ්‍යක්ෂ ජනරාල් - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය, කොළඹ 01.

04. කාර්ය සාධන දර්ශක

4.1 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්ය සාධන දර්ශක

අ.අ..	විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමවුමේ ප්‍රතිශතයක් තත්‍ය නිමවුම (%) ලෙස		
		›100%	75% - 99%	50% - 74%
01	පාසල් හැර යන්නන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශයන්ට හෝ රැකියාවන්ට යොමු කිරීම	146%		
02	වැඩිහිටි හැඳුනුම්පත් අවශ්‍ය සියලු වැඩිහිටියන්ට හැඳුනුම්පත් ලබා දීම	126%		
03	සමාජ අරක්ෂණ යෝජනා ක්‍රම		85%	
04	දිස්ත්‍රික්කය තුළ ශාක හා වන ගහණ වර්ධනය	146%		
05	2022 වර්ෂයේ බී ලූණු වගාව හෙක්ටයාර් 1900 දක්වා වර්ධනය කිරීම		84%	

05. තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනාගත් තිරසර සංවර්ධන අරමුණු

තිරසර සංවර්ධන අරමුණු	ඉලක්ක	ජයග්‍රාහී දර්ශක	වර්ෂ අවසානයේ ප්‍රගතිය		
			0% - 49%	50% - 74%	75% - 100 %
1. සියලු තැන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම	ආර්ථික වශයෙන් හා ආහාරමය වශයෙන් අනාරක්ෂිත පවුල් හඳුනාගෙන සවිබල ගැන්වීම.	සවිබලගැන් වූ පවුල් ගණන		50%	
	ග්‍රාම නිළධාරී වසම් ග්‍රාමීය ආර්ථික පුනර්ජීවන කේන්ද්‍ර ලෙස සවිබල ගැන්වීම.	පිහිට වූ ආර්ථික පුනර්ජීවන කේන්ද්‍ර ගණන		60%	
	සෑම ගෘහ ඒකකයකම නිෂ්පාදන වැඩි කිරීම.	හඳුන්වා දුන් නිෂ්පාදන වැඩසටහන් ගණන		70%	
	ව්‍යවසායකත්ව සංවර්ධනය.	හඳුන්වා දුන් ව්‍යවසායකත්ව ප්‍රවර්ධන වැඩසටහන් ගණන	91%		
02.යහපත් පෝෂණ තත්වයන් දිනා ගැනීම තුළින් තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම.	2030 වන විට සාගින්න තුරන් කිරීම සහ විශේෂයෙන්ම ළදරුවන් ද ඇතුළත්ව දරිද්‍රතාවෙන් පෙළෙන සහ අවදානමට ලක් වී තිබෙන ජනතාව ආරක්ෂාකාරී, පෝෂණයෙන් යුක්, ප්‍රමාණවත් ආහාර වසර පුරා ලබා ගැනීමට හැකි බව තහවුරු කිරීම.	වැඩසටහන් සඳහා යොදවා ගත් පාසල් ප්‍රජාව හා ග්‍රාමීය ප්‍රජාව (සංඛ්‍යාව)			80%
		ආහාර හුවමාරු මධ්‍යස්ථාන ලෙස යොදා ගත් ආගමික මධ්‍යස්ථාන			
		වතු වගාවන් සඳහා යොදා ගත් වතු ප්‍රජාව (සංඛ්‍යාව)			

03.ආහාර සුරක්ෂිතාවය ඇති කිරීම,සෞඛ්‍ය ප්‍රවර්ධනය සහ කෘෂිකාර්මික සංවර්ධනය	ආහාර සුරක්ෂිතතාවය, භූමි සම්පතේ තිරසරභාවය තහවුරු කරමින් තාර්කික ලෙස ඉඩම් සම්පත භාවිතය ප්‍රවර්ධනය කිරීම.	වගා කරන ලද හෙක්/අක්. ප්‍රමාණය		60%	
	වගා නොකළ පුරන් ඉඩම් අස්වැද්දීම තුළින් ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීම.	අස්වද්දන ලද පුරන් කුඹුරු හෙක්/අක්. ප්‍රමාණය			
04. සාගින්න නැතිකර, ආහාර සුරක්ෂිත තාවය සහ යහපත් පෝෂණ තත්වයන් දිනාගෙන තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධන කිරීම.	ග්‍රාමීය ප්‍රජාව හැකිතාක් කෘෂිකර්මාන්තය කෙරෙහි යොමු කිරීම තුළින් ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීම	පෝෂණය තහවුරු කළ පවුල් ගණන		100%	
05. නිරෝගී ජීවිත සහතික කර සෑම වයසකම සිටින සියල්ලන්ගේම සුබසාධනය ප්‍රවර්ධනය කිරීම	අත්‍යාවශ්‍ය සෞඛ්‍ය සේවා ආවරණය (සාමාන්‍ය ජනතාව සහ වඩාත් පහසුකම් අඩු ජනගහණයන් අතර ප්‍රජනන,මාතෘ,ළදරු, ළමා සෞඛ්‍ය, බෝවන රෝග, බෝ නොවන රෝග සහ සේවා පහසුකම් සඳහා වන සුලභතාවය)	සහන සැලසූ පුද්ගලයින් / පවුල් ගණන			90%
	වයස අවුරුදු 3 - 5 අතර මුල් ළමාවියේ දරුවන් සඳහා නිවැරදි පෙර පාසල් අධ්‍යාපනයක් ඇති කිරීම	පෙර පාසල් අධ්‍යාපනයට යොමු කරන ලද ළමයින් ගණන			80%
	අපේක්ෂිත මට්ටමින් දැනුවත් කිරීම් සිදු කිරීම හා මුල් ළමාවියේ දරුවාගේ සමස්ථ සංවර්ධනය පිළිබඳව ප්‍රජාව දැනුවත් වීම.	පවත්වන ලද දැනුවත් කිරීම් ප්‍රමාණය		55%	
	තෝරා ගත් සියළුම ප්‍රතිලාභීන් සඳහා දීමනාව ගෙවීම.	ප්‍රතිලාභීන් ගණන			90%
	දරුවන්ගේ පෝෂණ මට්ටම ඉහළ නැංවීම	පෝෂණය තහවුරු වූ දරුවන් ගණන		60%	
	ලියාපදිංචි සියළුම මව්වරුන් සඳහා ප්‍රතිලාභය ගෙවීම හා මව්වරුන් ගේ පෝෂණය ඉහළ නැංවීම	ප්‍රතිලාභ ලද මව්වරුන් ගණන			91.67%
	සියළුම දරුවන් සඳහා අවශ්‍ය රැකවරණය හා පහසුකම් සැලසීම.	රැකවරණය ලද දරුවන් ගණන		98.5%	
	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ගුරු පුහුණු වැඩසටහන් සඳහා සම්බන්ධ වීම.	සාර්තකව වැඩසටහන් නියමිත කාලය තුල දී සිදුකිරීම			90.91%
06. නිරෝගී ජීවිත සහතික කර සෑම වයසකම සිටින සියල්ලන්ගේම සුබසාධනය ප්‍රවර්ධනය කිරීම	මානසික සෞඛ්‍ය හා යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම, මධ්‍යසාර භාවිතය වැළැක්වීම සඳහා මහපෙන්වීම, සියදිවි නසා ගැනීම අවම කිරීම සඳහා දැනුවත් කිරීම	විසඳන ලද ගැටළු ගණන			75%
07. පරිපූර්ණ, සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම.	2030 වන විට සියළුම ගැහුණු ළමුන්ට සහ පිරිමි ළමුන්ට ගුණාත්මක වශයෙන් ඉහළ පූර්ණ ළමාවිය සංවර්ධනයට, සත්කාරක සේවාවන්ට සහ පූර්ව ප්‍රාථමික අධ්‍යාපනයට ප්‍රවේශ වීමේ අවස්ථාව පැවතීම සහ එමඟින් ඔවුන් ප්‍රාථමික අධ්‍යාපනයට සූදානම්ව සිටින බව තහවුරු කිරීම.	රැකවරණය ලබා දුන් ගැහුණු ළමුන් සංඛ්‍යාව			75%
08. ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය	මානසිකව දිස්ත්‍රික් කාන්තා බල මණ්ඩලයේ රැස්වීම් පැවැත්වීම, නිලවරණය පැවැත්වීම	සවිබල ගැන් වූ කාන්තාවන් ගණන			75%
	මානසිකව වනිතා සංවර්ධන නිලධාරින්ගේ ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම				

	උපදේශන වැඩසටහන් පැවැත්වීම				
09. පිරිසිදු ජලය හා සනීපාරක්ෂාව	2030 වන විට සියළු දෙනාට සමානාත්මතාවයෙන් යුතුව ආරක්ෂාකාරී සහ අඩු මිලකට පානීය ජලය ලබාගැනීමට හැකිවීම	නිම කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව		60%	
	2030 වන විට ජල දූෂණය අඩු කරමින් ජලයේ ගුණාත්මක භාවය ඉහළ නැංවීම, හානිකර විෂ රසායනික සහ වෙනත් ද්‍රව්‍ය බැහැර කිරීම සහ මුදාහැරීම තුරන් කිරීම,පිරිපහදු නොකරන ලද අපජලය මුදාහැරීම අඩු කිරීම සහ ජලය සැලකිය යුතු මට්ටමින් ප්‍රතිචක්‍රීකරණය සහ ආරක්ෂාකාරීව නැවත භාවිතා කිරීම	නිම කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව		60%	
10. සැමට ජලය ලබා ගැනීම සහ ඒවායේ තිරසර කළමනාකරණය සහතික කිරීම	ගුණාත්මක භාවයෙන් යුක්ත පානීය ජලය සැපයීම	පිරිසිදු ජලය ලැබෙන පවුල් සංඛ්‍යාව		70%	
	භූමි ඵලදායිතාවය ඉහළ නැංවීමට විධිමත් ඉඩම් කළමණාකරණ විධි ප්‍රවර්ධනය කිරීම.				
11. සියල්ලන් සඳහාම පෝෂිත, පරිපූර්ණ සහ තිරසර ආර්ථික සංවර්ධනය ,පූර්ණ, ඵලදායී සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම	සත්‍ය ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදනයේ වාර්ෂික වර්ධනය, 8.4.2 දේශීය ද්‍රව්‍ය පරිභෝජනය, ඒක පුද්ගල දේශීය ද්‍රව්‍ය පරිභෝජනය සහ දළ දේශීය නිෂ්පාදනයට අදාළව දේශීය ද්‍රව්‍ය පරිභෝජනය.	ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව		70%	
	විගමණික ශ්‍රමිකයන්ගේ ආරක්ෂාව, සුබසාධනය සහ සාමාජීය, ආර්ථික, අධ්‍යාපන අවශ්‍යතා ඉහල නැංවීම	රැස්වීම් ප්‍රමාණය		100%	
		අධීක්ෂණය කරන පවුල් පසුබිම් වාර්තා ප්‍රමාණය,		72%	
		සැලසුම් කළ ව්‍යාපෘති ප්‍රමාණය		60%	
12. සවිමත් යටිතල පහසුකම් ගොඩනැඟීම, පරිපූර්ණ සහ තිරසර කාර්මීකරණය ප්‍රවර්ධනය කර නව්‍යකරණය දිරිගැන්වීම.	ආර්ථික සංවර්ධනය සහ මානව යහපැවැත්ම වෙනුවෙන් සියළු දෙනාටම ලබාගත හැකි සහ ප්‍රවේශය විය හැකි වීම අවධානයට ගෙන කලාපීය සහ ජාතික දේශසීමාවන් අතර සිදු කරන යටිතල පහසුකම් ද ඇතුළත්ව ගුණාත්මක වශයෙන් ඉහළ විශ්වාසදායී තිරසර සහ ආපදාවන්ට ඔරොත්තු දෙන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම	නිම කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව		60%	
	ආර්ථික සංවර්ධනය සහ මානව යහපැවැත්ම වෙනුවෙන් සියළු දෙනාටම ලබාගත හැකි සහ ප්‍රවේශය විය හැකි වීම අවධානයට ගෙන කලාපීය සහ ජාතික දේශසීමාවන් අතර සිදු කරන යටිතල පහසුකම් ද ඇතුළත්ව ගුණාත්මක වශයෙන් ඉහළ විශ්වාසදායී තිරසර සහ ආපදාවන්ට ඔරොත්තු දෙන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.				90%
	2030 වන විට සියළුදෙනාට සමානාත්මතාවයෙන් යුතුව ආරක්ෂාකාරී සහ අඩු මිලට පානීය ජලය ලබාගැනීමට හැකිවීම. 2030 වන විට ජල දූෂණය අඩුකරමින් ජලයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම, හානිකර විෂ රසායනික සහ වෙනත් ද්‍රව්‍යය බැහැර කිරීම හා මුදා හැරීම තුරන් කිරීම, පිරිපහදු නොකරන ලද අපජලය මුදාහැරීම අඩු කිරීම සහ ජලය සැලකියයුතු මට්ටමින් ප්‍රතිචක්‍රීකරණය සහ ආරක්ෂාකාරීව නැවත භාවිතා කිරීම.	ඉදිකරණ ලද ප්‍රතිආශ්‍රැතකරණ ජල පද්ධති සංඛ්‍යාව සහ එම පද්ධති සඳහා ගෙවන ලද විදුලි බිල්පත් ප්‍රමාණය		60%	

	දිස්ත්‍රික්කයේ තුල ඇති ඛණිජ සම්පත් හඳුනා ගැනීම.	යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේදී ඇති විය හැකි ගැටළු අවම කිරීම		70%	
	තිරසර සංවර්ධනය පිණිස යටිතල පහසුකම් ඉහල නැංවීම.	ක්‍රියාත්මක කිරීම සඳහා තෝරාගත් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම මඟින් අපේක්ෂිත යටිතල පහසුකම් සංවර්ධනය සපුරා ගැනීම		60%	
13. නගර සහ ජනාවාස පරිපූර්ණ, ආරක්ෂිත, සවිමත් සහ තිරසර ලෙස සකස් කිරීම	උරුමයේ ආකාරය, පරිපාලන මට්ටම, වියදම් ආකාරය සහ පුද්ගලික මුල්‍ය යෙදවුම් අනුව සියලු සංස්කෘතික සහ ස්වභාවික උරුමයන් රැකගැනීම, ආරක්ෂාව සහ සංරක්ෂණය වෙනුවෙන් සිදුකරන සමස්ත ඒක පුද්ගල වියදම කළමනාකරණය කිරීම	ආරක්ෂාව තහවුරු කරන ලද ජනාවාස සංඛ්‍යාව			85%
	ඉඩම් ගැටළු විමර්ශනය කර ගැටළු නිරාකරණය කිරීම	නිරවුල් කරන ලද ආරවුල් ප්‍රමාණය			90.91 %
14. තිරසර පරිභෝජන හා නිෂ්පාදන රටාවක් ඇති කිරීම	ආහාර සුරක්ෂිතතාවය , භූමි සම්පත් තිරසාරභාවය තහවුරු කරමින් තාර්කික ලෙස ඉඩම් සම්පත භාවිතය ප්‍රවර්ධනය කිරීම.	කට්ටි සංඛ්‍යාව/ හෙක්ටයාර් සංඛ්‍යාව			100%
15. භූගෝලීය පරිසර පද්ධතීන්ගේ තිරසර භාවිතය, තිරසර වනාන්තර කළමනාකරණය, කාන්තාරීකරණයට එරෙහිව ක්‍රියා කිරීම ප්‍රතිස්ථාපනය කර ආරක්ෂා කර ප්‍රවර්ධනය කිරීම, ඉඩම් හායනය නැවැත්වීම සහ පුනරුත්තාපනය සහ ජෛව විවිධත්වය විනාශය නැවැත්වීම.	පරිසර නීතිරීති වලට අනුකූලව කටයුතු සිදුකිරීම	පවත්වන ලද පරිසර කමිටු ප්‍රමාණය	78.52%		
		විසඳන ලද පාරිසරික ගැටළු ප්‍රමාණය			92%
	ආරක්ෂිත වන සතුන්ගෙන් මහජනතාවට වන හානි පූර්ණය කාර්යක්ෂම කිරීම.	වන්දි කමිටු සංඛ්‍යාව (ආරක්ෂිත වන සතුන්ගෙන් සිදුවන හානි)			75%
	රජයේ අවශේෂ කැලෑ හඳුනා ගැනීම	ආරක්ෂා කරන ලද ඉඩම් ප්‍රමාණය			80%
	නාඋල බොබැල්ල ප්‍රදේශයේ පවතින බිනර ශාකය	සංරක්ෂණය කරන ලද ජෛව පද්ධති ගණන			80%
	දිස්ත්‍රික් වන ගහනය වර්ධනය කිරීමේ මාතලේ දිස්ත්‍රික් සැලසුම් සකස් කිරීම				80%
16. භෞමික පරිසරය පද්ධති ආරක්ෂා කිරීම, නැවත ඇති කිරීම හා තිරසර භාවිතයට පෙළඹවීම.	භූමි ඵලදායිතාවය ඉහළ නැංවීමට විධිමත් ඉඩම් කළමණාකරණ විධි ප්‍රවර්ධනය කිරීම.	ඵලදායිතාවය ඉහළ නැංවූ ඉඩම් ප්‍රමාණය			80%
17. තිරසර සංවර්ධනය සඳහා සාමකාමී සහ පරිපූර්ණ සමාජයක් ඇති කිරීම, යුක්තිය සඳහා සෑමට අවස්ථාව ලබා දීම සහ සෑම මට්ටමකම ඵලදායි	ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ඉඩම්වලට අදාල රාජකාරි කටයුතු නිසි ලෙස පවත්වාගෙන යාම පිළිබඳව අධික්ෂණය කිරීම				85%

වගකීම් සහිත පරිපූරණ ආයතන ගොඩනැගීම					
	ළමා හිමිකම් ප්‍රවර්ධනයට අදාලව සැලසුම් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය දත්ත යාවත්කාලීන කරීම	2019 වර්ෂයට අදාළ තොරුතුරු සංසන්දනය කර වෙනස්කම් හඳුනා ගැනීම			80%
	මාසික ප්‍රාදේශිය නිලධාරින් කැඳවා මසක් තුළ සිදුකළ රාජකාරි පිළිබඳසාකච්ඡා කිරීම හා සාරාංශ වාර්තා සකස් කිරීම	පවත්වනු ලබන රැස්වීම් සංඛ්‍යාව හා ඉදිරිපත් කරන වාර්තා ප්‍රමාණය			83.33 %
	අපයෝජනවලින් ආරක්ෂා කිරීම	පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව		70%	
	ළමා ආරක්ෂාවට අදාල ප්‍රධාන මාතෘකා 3 ක් ඔස්සේ ස්ටිකර් මුද්‍රණය කර පොදු ප්‍රවාහයන්වල හා පොදු ස්ථානවල ඇලවීම	එකඟවූ ඉල්ලුම් සැපිරීම		70%	
	වසම තුළ ග්‍රාමීය ළමා කමිටු පිහිටුවා ගැටළු හඳුනාගෙන ඒවාට විසඳුම් ලබාදීම හා ප්‍රාදේශිය කමිටුවට වාර්තා කිරීම	එකඟවූ ඉල්ලුම් සැපිරීම		63.64 %	
	ප්‍රාදේශීය මට්ටමින් දරුවන්ගේ ගැටළු හඳුනාගෙන ඒවාට විසඳුම් ලබා දීම හා දිස්ත්‍රික් කමිටුවට වාර්තා කිරීම	පැවැත්විය යුතු කමිටු වාර ගණන			80%
	දිස්ත්‍රික් මට්ටමින් ඇති ළමා ගැටළු සාකච්ඡා කර අවශ්‍ය පියවර ගැනීම	පැවැත්විය යුතු කමිටු වාර ගණන			80%
	පාසල් නොයන ළමුන් හඳුනාගෙන අවශ්‍ය ක්‍රියා මාර්ග සැලසුම් කිරීම	හඳුනා ගැනෙන ප්‍රමාණය			87%
	වතු දරුවන්ගේ සෞඛ්‍ය ආරක්ෂාව තහවුරු කිරීම	එකඟ වූ වැඩසටහන් සංඛ්‍යාව		66.67 %	
	අපයෝජනවලින් ආරක්ෂා කිරීම			70%	

5.2 තිරසර සංවර්ධන අරමුණු ජයග්‍රහණය සහ අභියෝගය

තිරසර සංවර්ධන අරමුණු	ජයග්‍රහණය	අභියෝග
1. සියළු තැන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම	• ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් 13 ක් ක්‍රියාත්මක වූ ඒ සඳහා රු. මි. 24 කට ආසන්න පිරිවැයක් දැරීම. ඒ තුලින් දුගී බව නිමා කිරීම සඳහා තව දුරටත් සමාජ ආරක්ෂණ වැඩපිළිවෙල, සමෘද්ධි සහනාධාර වැඩපිළිවෙල, අඩු ආදායම් ලාභීන් ඉලක්ක කරගන්නා ශිෂ්‍යත්ව වැඩසටහන් ක්‍රියාත්මක වේ.	• කොටියාශයේ අඩු ආදායම් ලාභීන් සංඛ්‍යාව ඉහල අගයක් ගැනීම • දේශගුණ විපර්යාස මත සිදුවන ස්වභාවික ආපදා හේතුවෙන් සිදුවන සෘජු ආර්ථික හානි • උද්ධමනය ඉහළ අගයක් ගැනීම • භාණ්ඩ හා සේවා වල මිල ගණන් ඉහල අගයක් ගැනීම බැංකු පොලී අනුපාතයන් ඉහළ අගයක් ගැනීම • මුදලේ ක්‍රය ශක්තිය අඩු වීම • රුපියල අවප්‍රමාණය වීම
2. සාගින්න නැති කර, ආහාර සුරක්ෂිතතාවය සහ යහපත් පෝෂණ තත්වයන් දිනාගෙන තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනයකිරීම	• මාතලේ දිස්ත්‍රික්කය තුළ මන්දපෝෂණ මට්ටම සෘණ අගයක් ගන්නා අතර, මරණ අනුපාතය පහළ මට්ටමක පවතී. ඒ තුළින් නිරූපණය වන්නේ නිරෝගීමත් ජනගහනයක් සිටින බවයි. එයින් ශ්‍රම බලකායට සේවා නියුක්ති අනුපාතය 94.2% ක් හා සේවා වියුක්ති අනුපාතය ක්‍රම ක්‍රමයෙන් අඩු අගයක් කරා ගමන් කරයි. • පසුගිය දස වසරකට සාපේක්ෂව මෙවර ජනගහන දරිද්‍රතා දර්ශකය 1%කින් අඩු වී ඇත.	• ඵලදායි හා තිරසාර කෘෂිකාර්මික භූමි ප්‍රමාණය සීමා සහිත වීම. • සීඝ්‍රයෙන් වෙනස්වන ජනගහන අනුපාතය • බෝ නොවන රෝගීන් සංඛ්‍යාව වැඩි වීම (දියවැඩියාව, කොලොස්ට්‍රොල්) • ආහාර මිල අසමානතා දර්ශකයන්ඉහල අගයක් ගැනීම • කෘෂි අපනයන සහනාධාර ඉතා ඉහල අගයක් ගැනීම • රාජ්‍ය වියදම වන කෘෂිකාර්මික දිශානුගත දර්ශකය ඉහල අගයක් ගැනීම
3. නිරෝගී ජීවිත සහතික කර සෑම වයසකම සිටින සියල්ලන්ගේම සුබසාධනය ප්‍රවර්ධනයකිරීම	• විධිමත් ලෙස සකස් කළ ගෘහ ඒකකයන් හා හිසට සෙවනක් නැති ප්‍රතිලාභීන් උදෙසා ඉදිකරන ලද නිවාස, වකුගඩු රෝගීන් සඳහා නිවාස, මත්ද්‍රව්‍ය නිවාරණය සඳහා ක්‍රියාත්මක වූ වැඩසටහන් සහ මාසිකව ලබා දුන් උපකරණ හා පැවැත්වූ සායන යනාදිය 2020 වර්ෂයේ දී මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සමාජ සුභසාධනය ප්‍රවර්ධනය කිරීම උදෙසා වැඩසටහන් හා ජයග්‍රහණයන් අත්පත් කර ගන්නා ලදි.	• සහනාධාර ප්‍රමාණය ප්‍රමාණවත් නොවීම • වකුගඩු රෝගීන් සංඛ්‍යාව ක්‍රම ක්‍රමයෙන් වැඩි වීම • මත් ද්‍රව්‍යට අබ්බැහි වූ පුද්ගලයන් සංඛ්‍යාව ඉහල අගයක් ගැනීම • මූලික අවශ්‍යතාවයක් වන (නිවාස) නොමැති පවුල් සංඛ්‍යාව ඉහල අගයක් ගැනීම
4. පරිපූර්ණ, සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සෑමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම	• පාසැල් හැර ගිය සිසු දරුවන් සඳහා අපොස සා.පෙ. හා අපොස උ.පෙල. සුදුසුකම් ලත් දරුවන් සඳහා නිපුණතා සංවර්ධන පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක වූ අතර ඔවුන්ගේ අභිමතාර්ථයක් ලෙස වෘත්තියක් සඳහා ශ්‍රම වෙළඳපලක් පිහිටු වීම.	• අපොස සා.පෙල හා උ.පෙල සමත් දරු පිරිස වැඩි ප්‍රමාණයක් සිටීම • ඵලදායිතා සම්මාන තරඟාවලියේ නිර්ණායකයන් සපුරා ගැනීමේ ඇති ගැටළු • සාක්ෂර අනුපාතය ඉහල අගයක් ගන්නා නිසා ශ්‍රම වෙළඳපොලේ ඇති තරඟකාරිත්ව පසුබිම

5. ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ලඟාකර සියලු කාන්තාවන් සහ ගැහැණු ළමුන් සවිබල ගැන්වීම	• ළමා ආරක්ෂාව පිළිබඳව වතු ප්‍රජාව සවිබලගැන්වීම හා ළමා නිවාසවල කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම හා සෞඛ්‍ය පහසුකම් වර්ධනය කිරීමත් ගැහැණු දරුවන්ට විධිමත් ආරක්ෂාවක් තවදුරටත් ගොඩනැංවීම කටයුතු සලසා ඇත • අඩු වයස් විවාහ වැළැක්වීම සඳහා ළමා ආරක්ෂණ කම්ටු, 1929 පැමිණිලි අංකය තුළින් වැඩසටහන් මාලාවක් මාතලේ දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කිරීම • දේශපාලන අධිකාරිත්වයට පලාත් පාලන මැතිවරණයට අයදුම් කරන පුද්ගලයන් අතරින් කාන්තාවට ඉඩ සලසා තිබීම	• මාතලේ දිස්ත්‍රික්කය තුළ අපචාර ප්‍රමාණය වැඩි වීම • කාන්තාගේ අධ්‍යාපනික දැනුම් මට්ටම පහත මට්ටමක පැවතීම • දේශපාලන අධිකාරිත්වයට කාන්තා දායකත්වයක් ලබා නොදීම
6. සැමට ජලය සහ සනීපාරක්ෂක පහසුකම් ලබාගැනීම සහ ඒවායේ තිරසර කළමනාකරණය සහතික කිරීම	• වතු ප්‍රජාවගේ සමාජ සුභසාධනය ඉහල නැංවීම සඳහාත් එළිමහනේ මල පහ තුරන් කිරීම සඳහා වැසිකිළි හා කැසිකිළ පහසුකම් ඇති කිරීම තුලින් ස්වභාවික ජලය ආරක්ෂා කිරීමට වැඩ පියවරක් මාතලේ දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක වේ. • ඊට අමතරව රසායනික බෙහෙත් වලින් වන හානි අවම කිරීම සඳහා කාබනික බෝග වගාවන් සඳහා මාතලේ දිස්ත්‍රික්කයේ ජනතාව පෙළඹවීම. ඒ තුලින් ස්වභාවික ජලය ආරක්ෂා කිරීමට වැඩ පියවරක් ලෙස මාතලේ දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක වේ. • වන වගාවන් හා වන රෝපණ වැඩ සටහන් මාතලේ දිස්ත්‍රික්කයේ ඉඩම් අංශය තුලින් මසකට වරක් ක්‍රියාත්මක වන අතර, ඒ තුලින් ජල පෝෂිත ප්‍රදේශයන් ආරක්ෂා කිරීමට පියවර ගෙන ඇත.	• පරිභෝජනය කළ හැකි ජලය ප්‍රමාණය සීමා සහිත වීම • බීමට ගන්නා ජලයේ හුණු ද්‍රාවණය ඉහල අගයක් ගැනීම • ජලයට මලපහ මිශ්‍ර වී තිබීම • ජල පෝෂිත ස්ථාන අඩු අගයක් ගැනීම • දේශගුණික විපර්යාසයන්ට නතු වීම (නියහය)
7. සියල්ලන් සඳහා දැරිය හැකි, විශ්වාසනීය, තිරසර සහ නවින බල ශක්ති සැපයුම සහතික කිරීම	• මාතලේ දිස්ත්‍රික්කයේ පාරිභෝගිකයන් සඳහා විදුලි සැපයුම 95% කට වඩා වැඩි ප්‍රමාණයකට සපයා තිබීම • මොරගහකන්ද ජල ව්‍යාපෘතිය තුලින් මෙ.වො. 25 ධාරිතාවයක් සමස්ත විදුලි ජනනය සඳහා දායක කෙරේ.	• බලශක්ති අපතේ යාම හා හානි වීම • බලශක්ති ක්ෂේත්‍රයට අනුබද්ධ ආයතන වල මානව සම්පතෙහි කුසලතා සංවර්ධනය ප්‍රමාණවත් නොවීම හා පරීක්ෂණ හා තාක්ෂණ කටයුතු ප්‍රමාණාත්මකව සිදු නොවීම • විදුලි නිෂ්පාදනය සඳහා අධික පිරිවැය • සමස්ත ප්‍රවාහන ක්ෂේත්‍රයම ආනයනික තෙල් මත යැපීම • සියළු සංවර්ධන ක්ෂේත්‍රයන්හි බලශක්ති ඉල්ලුම දිනෙන් දින ඉහලයාම • විදුලි බල ක්ෂේත්‍රයේ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා විශාල ආයෝජනයක් අවශ්‍ය වීම • පවතින සම්ප්‍රදායික ආයතනික රාමුව තුලින් බලශක්ති ක්ෂේත්‍රය අභියෝග සපුරාලීම සඳහා අවශ්‍ය දිරිමත් කිරීම් සිදු නොවීම • තිරසාර නොවන බලශක්ති පරිභෝජන රටාව
8. සියල්ලන් සඳහාම පෝෂිත, පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය, පූර්ණ, ඵලදායී සහ	• මාතලේ දිස්ත්‍රික්කය තුළ විවිධාංගීකරණය, තාක්ෂණය ඉහල නැංවීම සහ නවෝත්පාදනය තුලින් ඉහල වටිනාකම් එකතු කරන ලද සහ ශ්‍රමය	• ඒක පුද්ගලික ආදායම අඩු වීම • දේශීය නිෂ්පාදනයට යොමු වන සේවා නියුක්ති

යහපත් රැකියා සියල්ලන් සඳහා දැරිය හැකි, විශ්වානසීය, තිරසර ආර්ථික වර්ධනය, පූර්ණ, ඵලදායී සහ යහපත් රැකියා ප්‍රවර්ධනයකිරීම	සඳහා වැඩි ඉල්ලුමක් ඇති ක්ෂේත්‍රයන් පිළිබඳව සිදු කරනු ලබන ක්ෂේත්‍ර වැඩසටහන් ගණනාවක් 2020 වසර තුළ ක්‍රියාත්මක විය. • ඒ තුලින් ඵලදායී ක්‍රියාකාරකම් වලට සුදුසු රැකියා අවස්ථාවන් හා රැකියා වෙළඳපලවල් ගණනක් ක්‍රියාත්මක විය.	ප්‍රමාණය අඩු වීම • සංක්‍රමණික ප්‍රමාණය වැඩි වීම • තරහකාරීත්වය ඉහල අගයක් ගැනීම
9. සවිමත් යටිතල පහසුකම් ගොඩනැගීම, සංයුක්ත සහ තිරසර කාර්මීකරණය සියල්ලන් සඳහා දැරිය හැකි, විශ්වාසනීය, තිරසර ආර්ථික වර්ධනය, පූර්ණ, ඵලදායී සහ යහපත් රැකියා ප්‍රවර්ධනයකිරීම	• මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය තාක්ෂණය හා නව්‍යකරණයට හෙබි නවගොඩනැගිල්ලක් ඉදි කිරීම හා කාර්යාලය මඟින් මහජනයාට ලබා දෙන විවිධ සේවාවන් පරිඝණක දත්ත වැඩසටහන් අනුසාරයෙන් සිදු කිරීම • ආයතනික සේවාවන් අන්තර්ජාල පහසුකම් ඔස්සේ මහජන සුව පිණිස ක්‍රියාත්මක වේ.	• තාක්ෂණය ඉතා සීඝ්‍රයෙන් වෙනස් වීම • අනවසරයෙන් පරිඝණක පද්ධතියට ඇතුලු වීම (හැකර්ස්) • ජංගම දුරකථන හා තාක්ෂනයෙන් ආවරණය වන ජනගහන අනුපාතය ඉහල අගයක් ගැනීම
10. රටවල් තුළ සහ ඒවා අතර අසමානතාවය අඩු කිරීම	• ප්‍රජාතාන්ත්‍රික ජනරජය විසින් ක්‍රියාත්මක වන සර්වජන ඡන්ද බලය මාතලේ දිස්ත්‍රික්කයේ සියළුම පුරවැසියන්ට ලබා දී තිබීම.	• ඉල්ලුම් කරන දේශපාලන පක්ෂ ගණනාවක් පැවතීම
11. නගර සහ ජනාවාස පරිපූර්ණ, ආරක්ෂිත,සවිමත් සහ තිරසර ලෙස සකස් කිරීම	• මාතලේ දිස්ත්‍රික්කය තුළ උකුවෙල, රත්තොට යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වලඇාපදා තත්වය හේතුවෙන් ඇති වූ ඇාපදා හානි වලට පිළියමක් ලෙස ඇාපදා ගෙවීම, නිවාස ඉදිකිරීම්, යටිතල පහසුකම් දියුණු කිරීම ක්‍රියාවට නැංවුණි	• දේශගුණික විපර්යාසයෙන් සිදුවන නිවාස හානි • නගරවල පවත්නා ක්ෂුද්‍ර අංශමය පදාර්ථ වාර්ෂික මධ්‍යනය මට්ටම ඉහල අගයක් ගැනීම
12. තිරසර පරිභෝජන සහ නිෂ්පාදන රටාවන් සහතික කිරීම	• මාතලේ දිස්ත්‍රික්කය තුල කෘෂිකාර්මික යටිතල භෝග වගාවන් ක්‍රියාත්මක වේ. • අපද්‍රව්‍යය ප්‍රතිචක්‍රීකරණ වැඩසටහනක් ක්‍රියාත්මක වේ. දේශීය කර්මාන්ත හා කලා ගම්මාන ඉහල නැංවීමේ වැඩසටහනක් ක්‍රියාත්මක වේ. ඒ තුලින් කලාකරුවන් දිරිගැන්වීමට අවශ්‍ය කටයුතු සලසා තිබීම	• දෛනිකව එකතු වන කසළ ප්‍රමාණය මෙට්‍රික් ටොන් 30 කට වඩා වැඩි වීම • එළවලු භෝග වගාවන් සඳහා වෙළඳපලේදී සාධාරණ මිලකට අලෙවි කල නොහැකි වීම • එළවලු භෝග වගාවන්හි ඵලදාව විනාශ වන ප්‍රමාණය වැඩි වීම
13. දේශගුණික විපර්යාසය සහ ඒවායේ බලපෑම් වලට එරෙහිව කඩිනමින් ක්‍රියාත්මක කිරීම	• මාතලේ දිස්ත්‍රික්කය තුළ කාළගුණික වෙනස්වීම අවම කිරීම, ඒ අනුව හැඩගැසීම, බලපෑම අවම කිරීම සහ පූර්ණ අනතුරු සම්බන්ධයෙන් අධ්‍යාපනය, දැනුවත්භාවය ඉහල නැංවෙන වැඩසටහන් මාලාවක් ක්‍රියාත්මක විය.	• කාබන් පාද සටහන ඉහල අගයක් ගැනීම • හරිතාගාර වායු විමෝචනය අක්‍රමත් වීම • ආහාර නිෂ්පාදනයට තර්ජනයක් වන පරිදි ජාතික ප්‍රතිපත්ති සකස් වී තිබීම
14. තිරසර සංවර්ධනය සඳහා සාගර, මුහුදු සහ සාගර සම්පත් සංරක්ෂණය සහ පිරිමැසුම්දායී භාවිතය	• මාතලේ දිස්ත්‍රික්කය තුළ මිරිදිය මත්ස්‍ය කර්මාන්තය සඳහා ලෝක ආහාර වැඩසටහන යටතේ ප්‍රතිපාදන ලබා දී වැඩසටහන් ක්‍රියාත්මක විය. ඒ තුලින් ධීවර ප්‍රජාවන්ගේ ආර්ථික රටාව නහා සිටුවීම සඳහා කෘෂි, සත්ව ණය අරමුදල් වැඩසටහනක් ක්‍රියාත්මක වේ	• මිරිදිය මත්ස්‍ය පාලනය සඳහා වන තාක්ෂණික ක්‍රම වල පවතින නිහ බව • මිරිදය මත්ස්‍ය පාලනය සම්බන්ධව පවතින අනවබෝධය
15. භූගෝලීය පරිසර පද්ධතීන්ගේ තිරසර භාවිතය, තිරසර වනාන්තර කළමනාකරණය,	• මාතලේ දිස්ත්‍රික්කයේ සියළුම ජන කොටස් සඳහා ඉඩම් සඳහා නෛතික උරුමය ලබා දීමේ වැඩසටහන මේ වන විටත් ක්‍රියාත්මක වේ.	• සමස්ථ භූමි ප්‍රමාණයෙන් හානියට ලක් වී ඇති ප්‍රමාණය ඉහල අගයක් ගැනීම

කාන්තාරීකරණයට එරෙහිව ක්‍රියාකිරීම ප්‍රතිස්ථාපනය කර ආරක්ෂා කර ප්‍රවර්ධනයකිරීම, ඉඩම් හායනය නැවැත්වීම සහ පුනරුත්ථාපනය සහ ජෛව විවිධත්ව විනාශය නැවැත්වීම		• නීතිවිරෝධී වන ජීවීන් දඩයම් කිරීමේ ප්‍රමාණය ඉහල යාම • කඳුකර හරිත ආවරණ දර්ශකය අඩු මට්ටමක පැවතීම
16. තිරසර සංවර්ධනය සඳහා සාමකාමී සහ පරිපූර්නසමාජයන් ඇති කිරීම, යුක්තිය සඳහා සැමට අවස්ථාව ලබා දීම සහ සෑම මට්ටමකඵලදායී, වගකීම් සහිත පරිපූර්ණ ආයතන ගොඩනැඟීම	• මාතලේ දිස්ත්‍රික්කයේ සියළුම රාජ්‍ය අංශයන්වල කාර්යක්ෂම හා ඵලදායි දිස්ත්‍රික් පරිපාලනය ක්‍රමයක් ඇති කිරීම, රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනයන්ගේ සමන්විත සම්බන්ධීකරණ ජාලයක් ඇති කිරීම, සමාජ සුභසාධන හා සංස්කෘතික වැඩසටහන් හරහා සමාජ සංරක්ෂණයක් ඇති කිරීම, ජනතා අවශ්‍යතා මත පදනම් වූ යටිතල පහසුකම් ව්‍යුහයක් ඇති කිරීම හා අල්ලස හා දූෂණයෙන් තොර ඵලදායි වගකීම් යුක්ත විනිවිද භාවයකින් යුතු ආයතන පිහිටුවීම.	• සිය අවසන් රාජ්‍ය සේවා අත්දැකීම් සම්බන්ධයෙන් තෘප්තිමත් ජනගහන ප්‍රමාණය අඩු වීම • තොරතුරු දැන ගැනීමට අදාළ වන මහජන ප්‍රවේශ අවම මට්ටමක පැවතීම • තාක්ෂණික ගැටළු වැඩි මට්ටමක පැවතීම • සේවා නියුක්ත ප්‍රමාණයෙන් වැඩි කොටසක් අවුරුදු 55ට වැඩි වීම
17. ක්‍රියාවට නැංවීමේ ක්‍රම සවිමත් කිරීම සහ තිරසර සංවර්ධනය සඳහා වන ගෝලීය සහයෝගීතාවයේ පුනර්ජීවනය	• මාතලේ දිස්ත්‍රික්කය තුළ මූල්‍යමය, තාක්ෂණ, ධාරිතාවන් ගොඩනැංවීම, වෙළඳාම ප්‍රතිපත්ති සහ ආයතනික සංගතභාවය, විවිධ පාර්ශවයන්ගේ හවුල්කාරිත්වයන්, දත්ත අධික්ෂණය හා වගකීම් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය තුලින් විධිමත් වැඩසටහන් මාලාවක් දිස්ත්‍රික් ලේකම් තුමා මඟින් අධීක්ෂණය සිදු වීම.	• උද්දමනය ඉහල අගයක් ගැනීම • වැඩි බදු ප්‍රතිපත්ති • තාක්ෂණික වෙනස්වීම • රටවල් අතර අන්‍යෝන්‍ය සබඳතාවයන් අවම වීම • අපනයන කෘෂිකර්මාන්තය අඩු වීම • දත්තවල ඇති පරස්පරතාවය

06. මානව සම්පත් පැතිකඩ

6.1 සේවක කළමනාකරණය

අනුමත කාර්ය මණ්ඩල වාර්තාව - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

තනතුර	අනුමත කාර්යය මණ්ඩලය	පවතින කාර්යය මණ්ඩලය	පුරප්පාඩු / (අතිරික්ත)
ජ්‍යෙෂ්ඨ			
දිස්ත්‍රික් ලේකම් / දිසාපති	1	1	-
අතිරේක දිස්ත්‍රික් ලේකම්	2	2	-
අධ්‍යක්ෂ සැලසුම්	1	0	-1
ප්‍රධාන ගණකාධිකාරි	1	1	-
ප්‍රධාන අභ්‍යන්තර විගණන	1	1	-
සහකාර දිස්ත්‍රික් ලේකම්	1	1	-
ප්‍රාදේශීය ලේකම්	11	11	-
සහකාර ප්‍රාදේශීය ලේකම්	12	12	-
සහකාර අධ්‍යක්ෂ සැලසුම් / නියෝජ්‍ය අධ්‍යක්ෂ සැලසුම්	15	11	-4
සහකාර අධ්‍යක්ෂ (Supernumerary)	5	6	1
ගණකාධිකාරි	12	10	-2
ඉංජිනේරු	1	1	-
	63	57	අතිරික්ත 1 පුරප්පාඩු 7
තෘතික			
පරිපාලන නිලධාරි	12	9	-3
පරිපාලන ග්‍රාම නිලධාරි	11	5	-6
භාෂා පරිවර්තක සිංහල - ඉංග්‍රිසි	1	3	2
සිංහල - දෙමළ	4	0	-4
අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්	11	7	-4
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික නිලධාරි	1	1	-
	40	25	පුරප්පාඩු 17 අතිරික්ත 2
ද්විතීක			
සංවර්ධන සම්බන්ධීකාරක	8	6	-2
සංවර්ධන නිලධාරි	97	228	131
සංවර්ධන නිලධාරි(සංවර්ධන)	611	806	195
කාර්මික නිලධාරි	24	10	-14
සැලසුම් ශිල්පි	1	0	-1
කළමණාකරන සේවා නිලධාරි	330	300	-30
ග්‍රාම නිලධාරි	545	450	-95
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික සහකාර	13	10	-3
කාර්මික සහායක නිලධාරි	13	11	-2
	1642	1821	පුරප්පාඩු 147 අතිරික්ත 326
ප්‍රාථමික			
රියදුරු	30	29	-1
විදුලි කාර්මාක	1	0	-1
බංගලා භාරකරු	1	0	-1
කාර්යාල කාර්ය සහායක	88	76	-12
කාර්යාල කාර්ය සහායක (දෙපාර්තමේන්තුගත)	4	1	-3
එකතුව	124	106	පුරප්පාඩු 18

6.2 මානව සම්පත් අතිරික්තය හෝ පුරප්පාඩු පැවතීම ආයතනික කාර්ය සාධනය කෙරෙහි බලපෑම කෙටියෙන් විස්තර කරන්න

වාර්ෂික කාර්ය සාධන වාර්තාව, රාජ්‍ය ගිණුම් කාරක සභාව වෙත ඉදිරිපත් කළ යුතු වාර්තා ඇතුළු විවිධ වාර්තාවන් හා ලිපි, දෙමළ භාෂාවට පරිවර්තනය කිරීමට සිදු වන අතර දෙමළ භාෂාව පිළිබඳ දැනුම ඇති කාර්යාල නිලධාරීන් මඟින් එම කාර්යයන් ඉටු කර ගැනීමේදී ඒ පිළිබඳ පූර්ණ වගකීමක් ලබා ගැනීම ගැටළු සහගතය. එබැවින් එම කාර්යයන් මුදල් ගෙවා බාහිර පාර්ශවයන් වෙතින් ඉටු කර ගැනීමට සිදු වේ. එමෙන්ම දිස්ත්‍රික්කයේ විවිධ ආයතන විසින් පරිවර්තන කටයුතු සඳහා ඉල්ලීම්ද මෙම කාර්යාලයට ඉදිරිපත් කරනු ලැබේ. එබැවින් සිංහල - දෙමළ භාෂා පරිවර්තක නිලධාරියෙකුගේ සේවය මෙම කාර්යාලයට අත්‍යාවශ්‍ය වේ.

6.3 සේවක මණ්ඩල ධාරිතා වර්ධනය

අනු අංකය	පුහුණු පාඨමාලාවේ නම			මූල්‍ය ප්‍රගතිය	
		සහභාගි වූ සංඛ්‍යාව	ඇස්තමේන්තු කළ මුදල (රු)	වවුවර් වටිනාකම (රු)	ප්‍රගතිය %
1	MS -Excel	34	60,100.00	52,160.00	86.7%
2	MS -Excel	20	60,100.00	44,800.00	75.0%
3	වැටුප් පරිවර්තනය කිරීම පිළිබඳ පුහුණුව	43	41,600.00	40,100.00	96.0%
4	Net Working	29	56,750.00	37,420.00	66.0%
5	MS-Access	25	75,100.00	47,210.00	63.0%
6	ඉඩම් කළමනාකරණය පිළිබඳ පුහුණුව	56	33,940.00	13,055.00	38.0%
7	රාජ්‍ය මූල්‍ය කළමනාකරණය පිළිබඳ පුහුණුව	50	44,820.00	29,900.00	67.0%
8	විනය කාර්යපටිපාටිය පිළිබඳ පුහුණුව	36	49,240.00	24,015.00	49.0%
9	Web Designing I	21	69,550.00	38,475.00	55.3%
10	ක්ෂේත්‍ර පරීක්ෂණ වාර්තා සකස් කිරීම පිළිබඳ පුහුණුව	57	30,075.00	17,535.00	58.3%
11	කාර්යාල කළමනාකරණය පිළිබඳ පුහුණුව	51	49,750.00	28,660.00	57.6%
12	රජයේ විගණන කටයුතු පිළිබඳ පුහුණුව	63	40,900.00	20,360.00	49.7%
13	Integrted treasury management information system (ITMIS)	64	246,625.00	199,055.00	80.7%
14	Website Update & introducing updated softwear පිළිබඳ පුහුණු වැඩමුළුව	19	3,750.00	3,750.00	100%
15	MS-PowerPoint පිළිබඳ පුහුණු වැඩමුළුව	21	47,125.00	20,900.00	44.4%
16	රියදුරු කාර්යාභිවර්ධනය පිළිබඳ පුහුණු වැඩමුළුව	33	40,600.00	30,220.00	74.4%
	එකතුව	**622**	**950,025.00**	**647,615.00**	**68.2%**

07. අනුකූලතා වාර්තාව

අ.අ.	උපයෝගී අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවීම සඳහා කෙටි පැහැදිලි කිරීමක්	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍යාකරණ ක්‍රියාමාර්ග
01	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම්(වාණිජ අත්තිකාරම් ගිණුම්)	අනුකූල වේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අනුකූල වේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අනුකූල වේ		
1.6	වෙනත්	අනුකූල වේ		
02	පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	වෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීනකර පවත්වාගනෙ යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූල වේ		

3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍ර ලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
04	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
05	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
07	**විගණන හා කළමණාකරන කමිටුව**			
7.1	DMA චක්‍ර ලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාල වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ		
08	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍ර ලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍ර ලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍ර ලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු	අනුකූල වේ		

	කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම			
8.3	රාජ්‍ය මුදල් චක්‍ර ලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍ර ලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
09	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එලඹීම	අනුකූල වේ		
12	**රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන් වලට අනුකූල වීම	අනුකූල වේ		

12.2	හිහහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිහහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල නොවේ	නීතිපති උපදෙස් ඉල්ලා ඇත	
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ		
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට ඍජුවම ආදායමට බැ කර තිබීම	අනුකූල වේ		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල නොවේ	සංවර්ධන නිලධාරී කාර්ය මණ්ඩලය ඉක්මවා ඇත	අමාත්‍යාංශය වෙත දන්වා ඇත
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයින් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍ර ලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා	අනුකූල වේ		

	තිබීම			
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට **අනුකූල වේ** වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍ර ලේඛ අනුව පුරවැසි / සේවා ලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කොට තිබීම	අනුකූල වේ		
18.2	එම චක්‍ර ලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19	**මානව සම්පත් සැලස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍ර ලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහා වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ		
19.4	ඉහත චක්‍ර ලේඛයේ 6.5 ඡේදයප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලස්ම පිළියෙල කිරීම,ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		